# ථේරීගාථාවලින් හෙළිවන සාහිත්‍ය විදර්ශනාව හා ක්ෂණික අන්තර්දෘෂ්ටිය (Epiphany)

## (සෝමා, අම්බපාලි තෙරණින්ගේ ගාථා ඇසුරෙන්)

අපරැක්කේ සිරිසුධම්ම හිමි[1], පිටතලාවේ විමලසාර හිමි[2]

### හැඳින්වීම

ථේරීගාථා යනු මෙහෙණි සස්නෙහි පැවිදි වූ භික්ෂුණීන් අධිගත ඵල විශේෂයන් ප්‍රීති ප්‍රමෝදයෙන් සිහි කර උදන වශයෙන් පැවසූ ගාථාය. එහි තෙරණියන් විසින් (73 නමක් පමණ) පවසන ලද ගාථා 522ක් පමණ අන්තර්ගතය. ඛුද්දකනිකායට අයත් මෙම කෘතිය ආගමික, සාමාජික මෙන්ම සාහිත්‍යයික වටිනාකමකින් යුත් කෘතියකි. ඉන්දියානු කාව්‍ය සාහිත්‍යය අධ්‍යයනය කිරීමේදී ස්ත්‍රී පාර්ශ්වය රචනා කළ පද්‍ය ඇතුළත් පළමු කාව්‍ය සංග්‍රය වශයෙන්ද ථේරීගාථා හඳුනාගත හැකිය. එසේම ලෝක ස්ත්‍රී සාහිත්‍යයේ (Women's literature) හමුවන පැරණිතම කාව්‍ය සංග්‍රහය වශයෙන්ද ථේරීගාථා බුහුමනට පාත්‍ර වේ. (Hallisey, 2015: vii) මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් ථේරීගාථාවල පැනෙන සාහිත්‍යයික වටිනාමෙහි එක් පැතිකඩක් පිළිබඳ අවධානයට ගැනේ. ඒ සඳහා යොදගනු ලැබෙන්නේ සාහිත්‍ය හා කලා විචාරයේදී හමුවන එපිෆනි (Epiphany) සංකල්පයයි.

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ථේරීගාථා නමැති ප්‍රාථමික මූලාශ්‍රය මත පදනම්ව සිදු කෙරෙන අතර පුස්තකාලය හා අනතර්ජාලය පරිහරණය ඔස්සේ දත්ත රැස් කිරීම සිදු වේ. ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණ කෙරෙන අතර නූතන විචාර සංකල්ප කිහිපයක ආශ්‍රයද ඒ සඳහා යොද ගැනේ.

### සාකච්ඡාව හා ප්‍රතිඵල

ථේරීගාථා ශ්‍රී ලංකාව, ඉන්දියාව, චීනය, ජපානය, ටිබෙටය වැනි බුදුදහම ප්‍රචලිත වූ රටවල මිනිසුන් අතර ඉතා ජනප්‍රිය කෘතියකි. මෙහි පවතින සමාජ විද්‍යාත්මක, ඓතිහාසික හා සාහිත්‍යයික වටිනාකම් හේතුවෙන් රීස් ඩේවිඩ්ස්, කේ. ආර් නොර්මන්, චාර්ල්ස් හෙලිසි, ෂෙල්ඩන් පොලොක්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු වූ හැරිපර්ඩ් වැනි විද්වත්ගේ විමර්ශනයට පාත්‍ර වී තිබේ. 2015

[1] sudhaaparekke@gmail.com
[2] wimsarap@gmail.com

වසරේදී හාර්වඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය චාර්ල්ස් හෙලිසි අගනා පෙරවදනක් සහිතව ථේරීගාථා ඉංග්‍රීසියට පරිවර්තනය කර ඇත. එහිදී ඔහු ථේරීගාථාවල සාහිත්‍ය වටිනාකම හා එපිෆනි සංකල්පය පිළිබඳ වටිනා සාකච්ඡාවක නිරත වෙයි. එපිෆනි (Epiphany) නමැති සංකල්පීය වචනය ක්ෂණික අන්තර් දෘෂ්ටිය, ක්ෂණික දර්ශනය ලෙස සිංහලට පරිවර්තනය කළ හැකිය. එම ක්ෂණික අන්තර් දෘෂ්ටිය (Epiphany) තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය වන ලෙස කලාව භාවිත කරන්නේ කෙසේද යන කාරණයේදී වැදගත් වන සංකල්පයකි. (අමරකීර්ති, 2010: 67) කවියක ඇතුළත් සාහිත්‍යයික ආනන්දය සොයා යෑමට සහ සෞන්දර්යාත්මකව එහි සඳහන් විදර්ශනාත්මක බව හැඳින ගැනීමට එපිෆනි නමැති ක්ෂණික අන්තර්දෘෂ්ටිය මහත් රුකුලකි. ථේරීගාථා ජීවිතය ගැන ස්වාධීන සිතීමට ක්ෂණික ඥානනයක් ලබාදෙන කෘතියක් බවත් එම ක්ෂණික අන්තර් දෘෂ්ටියේ (Epiphany) ආලෝකය මිනිසාට ලෝකය පිළිබඳ නිදහසේ සිතීමට ඉඩ ලබාදෙන බවත් චාල්ස් හෙලිසි පවසයි. (Hallisey, 2015: ix) ථේරීගාථාවලින් හමුවන එපිෆනි හෙවත් අන්තර් දෘෂ්ටිය උදහරණ කිහිපයක් ඔස්සේ මෙහිදී සාකච්ඡා කෙරේ.

අභිසාරිකාවන් ළඟ ඇත්තේ කාමෝත්පාදක මනසක්යැයි සමජගත වූ මත වෙනුවට ඔවුන් තුළ තර්කය, දර්ශනය, කාව්‍යාත්මක කුශලතා මෙන්ම ආධ්‍යාත්මික විනීත බව වැනි ශක්‍යතා ඇති බවට ථේරීගාථාවලින් පාඨකයාට අන්තර්දෘෂ්ටියක් ලබා දෙනු ලැබේ. එය පද්‍යයකින් ලබාදෙන ක්ෂණික දර්ශනයකි. එම විදර්ශනාත්මක ක්ෂණික කියවීම වටහා ගැනීමට පාඨකයාට පෙහෝනා මනසක් හා නිදහස් දෘෂ්ටියක් පැවතිය යුතුය. අම්බපාලි, අඩ්ඪකාසි, විමලා ආදි තෙරණින් වහන්සේලා ගිහි කළ අභිසාරිකාවන් බව ඔවුහු නොබියව ප්‍රකාශ කළහ. ඔවුන් විසින් පවසන ලද උදානයන් අධ්‍යයනය කිරීමේදී පාඨකයා ලැබෙන ක්ෂණික දර්ශනය මනුෂ්‍යත්වය වටහා ගැනීමට මනා පිටුවහලක් සපයයි. අභිසාරිකාවන් සමග යහන්ගත වීමට ඕනෑතරම් පිරිමින් සිටියද ඔවුන් විවාහ කර ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වන්නේ නැත. අභිසාරිකාවන් සඳහා හිමිවන සමාජ සම්මතයත් ඔවුන් වෙනුවෙන් ගොඩනැගී ඇති පාරිභාෂික වචනමාලාවත් සමාජය ඔවුන් දෙස හෙළූ දෘෂ්ටිය වටහා ගැනීමට ප්‍රමාණවත්ය. එහෙත් භික්ෂුණී ශාසනයෙහි යසෝදරා, මහාප්‍රජාපතී ආදි දේවීවරුන්ටත් අම්බපාලි, අඩ්ඪකාසි, විමලා වැනි අභිසාරිකාවන්ටත් හිමිවූයේ එකම ආසනයක්ය. මෙමගින් පැහැදිලි වන්නේ බුදුදහම මූලිකත්වය ලබාදී ඇත්තේ අතීත චරිත ලක්ෂණයන්ට නොව එම චරිත සංස්කරණය කරගත් ආධ්‍යාත්මික විනීතභාවයට බවයි. මෙය ථේරීගාථා මිනිසාට මිනිසුන් පිළිබඳ සිතීමට ලබාදෙන අන්තර් දෘෂ්ටියයි.

අන්තර්දෘෂ්ටිය මගින් සිදු කෙරෙන අනෙකුත් සංකල්පීය වෙනස නම් සමාජයේ රෙගුලාසි ගත වී ඇති වැරදි දෘෂ්ටිවාදයන් ඉවත් කර ඒ දෙස අලුත් හා නිදහස් මානයකින් බැලීමට ඉඩ ලබාදීමයි. චාල්ස් ටේලර් පවසන්නේ විශිෂ්ට කවිය සියලු අන්තග්‍රාහී සම්මතයන් බිඳ ඍජු දර්ශනයක් ලබා දෙන බවයි. (Taylor, 2008: 460) එම කියමන ඉහත සාකච්ඡා කළ උදාහරණයෙන්ම තවදුරටත් පැහැදිලි කරගත හැකිය. අභිසාරිකාවන් පිළිබඳ සමාජ සම්මතය නම් ඔවුන් ලිංගික සන්තර්පණයන් සපයන ශ්‍රමිකයන් බවයි. එහෙත් ථේරීගාථා එම චරිතවල ඇති තර්කය, දර්ශනය, කාව්‍යාත්මක හැකියා හා ආධ්‍යාත්මික ශක්‍යතාව පිළිබඳ ඍජු දර්ශනයක් ලබාදෙයි. එම අන්තර් දෘෂ්ටිය ජනනය වීමට පාඨකයාටද සුපහන් මනසක් තිබිය යුතුය. ගිහිකල අභිසාරිකාවක වූ පැවිදිකල රහත් තෙරණියක වූ අම්බපාලි ථේරියගේ උදානය මෙම සංකල්පය තවදුරටත් වටහාගැනීමට යෝග්‍යතරය. ඇයගේ කෙස් කළඹ පූර්වයේ කළු පැහැති බඹරුන් බඳු පැහැ ගත් බවත් දැන් ජරාවෙන් දිරාගිය හණ කෙඳි වැනි බවත් අම්බපාලි තෙරණිය පවසයි. (ථෙරීගාථාපාළි, 2006: 60, 252 ගාථාව) අක්බඹරු පැහැ ඇති කෙස් කළඹක් යන යෙදුමෙන් සුන්දර රූමත් ස්ත්‍රියකද හෙණ කෙඳි වන් දිරාගිය වැහැරුණු ඉදුණු කෙස් වැටියකින් මැහැල්ලකද සිහිපත් වීම මෙම ගාථාවෙන් නැගෙන සාමාන්‍ය දෘෂ්ටියයි. (වික්‍රමසිංහ, 1966: 15) එහෙත් එම ගාථාවෙන් නැගෙන ක්ෂණික අන්තර් දෘෂ්ටිය ඉතා සියුම්ව වටහාගත යුත්තකි. එනම් අම්බපාලි තෙරණිය ගිහි කල අක්බඹරු පැහැ ඇති කෙස් කළඹත් පැවිදිකල දිරාගිය හණවන් කෙස් කළඹත් අතර වෙනසක් නොදැකීමයි. එවිට දිරාගිය හණවන් කෙස් කළඹ කෙරෙහි පිළිකුලක් හෝ ශෝකීභාවයක් හට නොගනී. තම ශරීරාංග පිළිකුලෙන් හෙළා දැකීමට නොව යථාර්ථවාදීව එහි ආස්වාදය නිස්සරණාත්මක හැඟීමෙන් බාල, තරුණ, මහලු තුන් අවධියේම විඳීමට අවශ්‍ය අන්තර් දෘෂ්ටිය මෙම ගීයෙන් ක්ෂණිකව සැපයේ. ථේරීගාථා ලෝකයේ බොහෝ විද්වතුන් අතර ප්‍රසාදයට ලක් වන්නේ මෙවැනි ගුණාංග පදනම් කරගෙනය. ස්ත්‍රී සාහිත්‍යය වැනි මානයන් ඔස්සේ වත්මන් වියතුන් වසර 2000කට පූර්වයේ රචිත ථේරී ගී වැනි බෞද්ධ ගාථා සුවිශේෂී සාහිත්‍ය අගයකින් යුත් පද්‍ය සම්ප්‍රදායක් ලෙස අගය කරන්නේ එබැවිනි.

සෝමා තෙරණිය මාරයාට පවසන ප්‍රකාශයද ඉතා ප්‍රබල අන්තර්දෘෂ්ටියක් සපයන්නකි. එමගින් ථේරී ගීවල සාහිත්‍ය වටිනාකමට වඩා දර්ශනික වටිනාකම පැහැදිලි වෙයි. සෝමා තෙරණිය වෙත එළඹෙන මාරයා දෑඟිලි නුවණින් යුත් ස්ත්‍රියට බුද්ධාදි ඍෂීන් විසින් අවබෝධ කරන ලද නිර්වාණය නමැති පරමාස්වාදය විඳීමට ශක්‍යතාවක් නැති බව පවසයි. එයට පිළිවදන් සපයන සෝමා තෙරණිය සිත අර්හන්ත මාර්ග සමාධියෙන් සමාහිත කල්හි ස්ත්‍රීභාවය අපට කුමක් කරන්නේද

යනුවෙන් ප්‍රකාශ කරයි. (ථෙරීගාථාපාළි, 2006: 20, 60-62 ගාථා) සෝමා තෙරණිය ලබා දෙන පිළිතුර වර්තමානයේද සම්ප්‍රදායානුකූල සම්මත බිඳ දැමීමට සමත් ප්‍රබල අන්තර් දෘෂ්ටියක් ලබා දෙයි. සමාජයෙහි ප්‍රචලිත සම්මතය නම් ස්ත්‍රියකට බුදු විය නොහැකි බවයි. සෝමා තෙරණියගේ ගාථා ප්‍රකාශනයෙන් ඇතිවන අන්තර්දෘෂ්ටිය ඒ සඳහා කරුණු ගවේෂණයට අවශ්‍ය සාර්ථක එළඹුමකට මග පාදයි. සෝමා තෙරණියගේ අදහස වන්නේ සිත අර්හන්ත මාර්ග සමාධියෙන් සමාහිත කල්හි ස්ත්‍රීභාවය අපට කුමක් කරන්නේද යන්නයි. ඉන් ලැබෙන අන්තර් දෘෂ්ටිය නම් සිත සමාධි ගත කිරීමට ස්ත්‍රී - පුරුෂ භේදයක් නොමැති බවයි. බුද්ධත්වය නොහොත් මනස උපරිම තලයට සමාධිගත කිරීම, මනෝ මූලිකව ප්‍රඥා මහිමයෙන් සිදුවන ක්‍රියාවලියක් මිස ස්ත්‍රී පුරුෂ භේදය සලකන්නක් නොවේ. බොහෝ මිනිස්සු බුද්ධත්වය ලද හැක්කේ පිරිමි ආත්මභාවයක් ලදහොත් පමණකැයි පවසති. එහෙත් සෝමා තෙරණියගේ ගාථාවලින් එකී සම්මත මත බිඳ දමා ඍජු හා ක්ෂණික දර්ශනයක් ලබා දී තිබේ. මේ පිළිබඳ වටිනාම දේශනාව සඳහන් වන්නේ බුද්ධවංස පාළියෙහිය. එහි බුද්ධත්වයට අවශ්‍ය සම්පත්ති පැහැදිලි කර ඇති අතර ඉන් එක් කරුණක් ලිංග සම්පත්තිය වශයෙන් දක්වයි. (බුද්ධවංස පාළි, 2008: 30, 58 ගාථාව) එහි ලිංග සම්පත්තිය යනු ස්ත්‍රී හෝ පුරුෂ යනුවෙන් එක් පාර්ශ්වයකට බෙද වෙන් කළ සම්පත්තියක් නොව පොදුවේ ඕනෑම මිනිසෙකුට විවෘත සම්පත්තියකි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේද 'ලිංග සම්පත්ති හේතු' යන්න 'ලිංග සම්පත් යැ' යනුවෙන් අර්ථ දක්වා ඇති අතර එය නිශ්චිත එක් ලිංගික පර්ශ්වයක් වෙනුවෙන් වෙන් කර නැත. පසුකාලීන විචාරකයන් බුද්ධත්වය වැනි උත්තරානුභූතික මානසික එළඹුම පිරිමි පාර්ශ්වයට පමණක් අවබෝධ කළ හැකි තත්ත්වයක් ලෙස අර්ථ ගැන්වීමට උත්සහ දරා ඇත. එහෙත් එවැනි සම්මත දෙස නිරවද්‍යව බැලීමට අවශ්‍ය අන්තර් දෘෂ්ටීන් ත්‍රිපිටකයේ හමුවන පැරණිතම මූලාශ්‍රයක් වන ථේරීගාථාවලින් සපයා ඇත.

සමාලෝචනය

ඉහත සඳහන් කරුණුවලට අනුව ථේරීගාථා යනු ආගමික, සාමාජික පමණක් නොව සාහිත්‍යයික වටිනාකමින් යුත් කෘතියක් බවත් එහි සඳහන් ගාථාවලින් ලබාදෙන ක්ෂණික අන්තර් දෘෂ්ටිය ජීවිතය ගැන ස්වාධීන සිතීමට හා සාම්ප්‍රදයික සම්මතයන්ගෙන් නිදහස්ව බැලීමට අවශ්‍ය විදර්ශනාව ලබාදෙන බවත් පැහැදිලිය.

ප්‍රමුඛ පද: අන්තර් දෘෂ්ටිය, ථේරී ගාථා, සාහිත්‍යය, නිදහස

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ථෙරීගාථාපාළි. (ඛුද්දකනිකාය)*. (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,

*බුද්ධවංසපාළි. (ඛුද්දකනිකාය).* (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*Therīgāthā* (Poems of the First Buddhist Women), (2015). (tr.) Charles Hallisey, Cambridge: Harvard University Press.

අමරකීර්ති, ලියනගේ. (2010). *පහන සහ කැඩපත.* බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

වික්‍රමසිංහ, මාර්ටින්. (1966). *තේරි ගී,* රාජගිරිය: මවුන්ටන් ප්‍රකාශකයෝ.

Taylor, Charles. (2008). *Sources of the Self. The Making of Modern Identity,* Cambridge: Cambridge University Press.